National Science Foundation
30 JUL 2015
NSF
Colombo

# සංක්ෂිප්තය

ශ්‍රී ලංකාවේ කුරුඳු පත්‍ර හා පැඟිරි තෙල් නිෂ්පාදන කර්මාන්තයේ වත්මන් ක්‍රියාකාරිත්වය හා එහි ප්‍රමාණාත්මක හා ගුණාත්මක මානයන් පිළිබඳව විමර්ශනය කරමින්, එම කර්මාන්තයේ ප්‍රවර්ධනය උදෙසා සුදුසු ප්‍රතිපත්තිමය යෝජනා සහ ක්‍රමෝපායයන් ඉදිරිපත් කිරීමේ අරමුණින් මෙම අධ්‍යයනය කුරුඳු පත්‍ර ආශ්‍රිත තෙල් සම්බන්ධව ගාල්ල හා මාතර දිස්ත්‍රික්කවල කර්මාන්තකරුවන් 125ක් හා පැඟිරි තෙල් සම්බන්ධව හම්බන්තොට හා රත්නපුර යන දිස්ත්‍රික්කවල කර්මාන්තකරුවන් 129ක් අධ්‍යයනයට ඇතුළත්ව 2013 වර්ෂයේ දී සිදු කෙරිණි.

ගාල්ල හා මාතර යන දිස්ත්‍රික්ක තුළ සිදු කළ අධ්‍යයනයට අනුව ශ්‍රම සූක්ෂම කර්මාන්තයක් වන කුරුඳු තෙල් කර්මාන්තය සඳහා බහුතරයක් (86%) යොමු වී ඇත්තේ එය ප්‍රදේශයට ආවේණික කර්මාන්තයක් වන බැවිනි. තෙල් නිස්සාරණය සඳහා පත්‍ර සපයා ගැනීමේදී, තමන් සතු ඉඩම්වලින් පමණක් නොව බදු ගත් ඉඩම් හා වෙනත් ගොවීන්ගෙන් හා සැපයුම්කරුවන්ගෙන් මිලට ලබාගත් පත්‍ර භාවිත කර ඇත. කර්මාන්තකරුවන් අතරින් 18%ක් අවුරුදු 30කට වඩා පළපුරුද්දක් ලබා ඇති අතර ගාල්ල හා මාතර දිස්තික්කවල පිළිවෙළින් 67%ක් හා 70%ක් වසර දහයකට වඩා පළපුරුද්දක් ලබා ඇත. එනමුත් එක් වඩියක දී ලබා ගෙන ඇති තෙල් ප්‍රමාණය හා පළපුරුද්ද අතර සබඳතාවක් පවතින බවට සංඛ්‍යානමය වශයෙන් තහවුරු නොවේ. තෙල් කර්මාන්තයේ නියැලෙන්නන් අතරින් බහුතරයක් (61%) තෙල් මඩු හිමි අය වේ. ඔවුහු තෙල් මඩු කුලී පදනම මත ලබාදෙන අතර ඒ සඳහා එක් වඩියකින් තෙල් බෝතල් ½ක් අය කරති. ගාලු දිස්ත්‍රික්කය තුළ රාජ්‍ය හා පෞද්ගලික ආයතන වල දැඩි මැදිහත්වීමෙන් හඳුන්වා දී ඇති 'මීටියාගොඩ තාක්ෂණය' නමින් ප්‍රචලිත තාක්ෂණය ගාලු දිස්ත්‍රික්කයේ බොයිලේරු හිමියෝ 81%ක් භාවිතා කරති. එම තාක්ෂණය භාවිතයෙන් වඩියකට බෝතල් 5ක් පමණ නිෂ්පාදනය කරන අතර ඒ අනුව අක්කරයක කුරුඳු කොළ සඳහා ඉහළ මිලක් (රු.8000-10,000) නියම වී ඇත. මාතර මෙන්ම මීටියාගොඩ තාක්ෂණය භාවිතය අඩු මට්ටමක (61%) පවතී. ඒ අනුව වඩියකින් නිස්සාරණය කරනු ලබන තෙල් බෝතල් ප්‍රමාණය 3.5ක් පමණ වේ. ගාලු දිස්ත්‍රික්කයේ තරම් කුරුඳු වගාවට හිතකර පාංශු හා පාරිසරික තත්ත්වයන් ද මාතර දිස්ත්‍රික්කයේ නොපවතී. තෙල් කර්මාන්තය තරඟකාරී ලෙස ක්‍රියාත්මක නොවන බැවින් කුරුඳු කොළ සඳහා ද අඩු ඉල්ලුමක් (රු. 2000-4000) පවතී. ගබඩා පහසුකම් ප්‍රමාණවත් නොවීම හේතුවෙන් 40%ක් පමණ කර්මාන්තකරුවන් එළිමහනේ කොළ ගබඩා කිරීම, තෙල් මඩු ගුණාත්මක තත්ත්වයට හා තෙල් නිෂ්පාදකතාවයට අහිතකර ලෙස බලපා ඇත.

රත්නපුර හා හම්බන්තොට දිස්ත්‍රික්කවල දී අධ්‍යයනයට ලක් කළ පැඟිරි තෙල් කර්මාන්තය ද ප්‍රදේශයට ආවේණික කර්මාන්තයකි. පැඟිරි වගාවන් සතු අය පමණක් මෙම කර්මාන්තයේ

නියැළෙති. වසර 30කට අධික පළපුරුද්ද ලත් පැඟිරි කර්මාන්තකරුවන් ප්‍රමාණය 29% වුවද බොයිලේරු හිමියන් ප්‍රමාණය අඩු අගයක (16%) පවතී. අනෙකුත් පැඟිරි ගොවීහු වඩියක මුළු නිෂ්පාදනයෙන් 1/6ක් කුලී ලෙස ලබා දී තෙල් නිස්සාරණය කරති. දිස්ත්‍රික්ක දෙකේ ම කර්මාන්තකරුවන් අතරින් 95%ක් ම භාවිතා කරන්නේ සම්ප්‍රදායික තාක්ෂණයයි. රත්නපුර දිස්ත්‍රික්කයේ කර්මාන්තකරුවන් එක් වඩියකින් ලබා ගෙන ඇති සාමාන්‍ය තෙල් අස්වැන්න බෝතල් 5.58 වන අතර හම්බන්තොට දිස්ත්‍රික්කයේ වඩියකට බෝතල් 4.27කි. අධ්‍යයන ප්‍රදේශවල නව පැඟිරි වගාවන් ආරම්භ කිරීමේ ප්‍රවණතාවයක් දක්නට නොමැති අතර පවතින වගාවන් ද අභාවයට යමින් පවතී. රත්නපුර දිස්ත්‍රික්කයේ ගොවීහු අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මඟ පෙන්වීම අනුව පැඟිරි ඉඩම්වල ගම්මිරිස් වගාවට යොමු වීම හේතුවෙන් පැඟිරි වගාවේ අනාගතය අවිනිශ්චිතය. ප්‍රමාණවත් ගබඩා පහසුකම් නොමැති වීමෙන් කොළ තෙමීම, දැඩි ලෙස වියළී යාම, පළිබෝධකයන් හානි කිරීම නිසා තෙල්වල ගුණාත්මයට හා ප්‍රමාණාත්මයට එය බලපා ඇති අතර අස්වනු නෙළන කාලය තුළ දී වැඩිපුර කොළ ගබඩා කර ගැනීමට මෙය බාධකයක් වී ඇත.

කුරුඳු හා පැඟිරි පත්‍ර තෙල් කර්මාන්තය ලෝක තත්ත්වයන් හා සසඳා බැලූ කළ, තාක්ෂණය භාවිතය අතින් නොදියුණු මට්ටමක පවතී. එබැවින් කුරුඳු පත්‍ර හා පැඟිරි තෙල් නිස්සාරණ කර්මාන්තය ගුණාත්මකව හා ප්‍රමාණාත්මකව නඟා සිටුවීමට තාක්ෂණික හා උපදේශනාත්මක සේවා සැපයීම සඳහා පියවර ගත යුතුය. කර්මාන්තයේ ඉදිරි වර්ධනය සඳහා අවශ්‍ය සැලසුම් සැකසීම සඳහා දත්ත පද්ධතියක අවශ්‍යතාව පැහැදිලි වෙයි. සුළු පරිමාණ කුරුඳු හා පැඟිරි තෙල් කර්මාන්තකරුවන් සංවිධාන ගත කිරීම තුළින් කර්මාන්තයේ ප්‍රවර්ධනය උදෙසා ඔවුන්ගේ දායකත්වය ලබා දීම, නිෂ්පාදන විවිධාංගීකරණය සැලකිල්ලට ගෙන මේ සඳහා වන රාජ්‍ය ආයෝජනය ඉහළ නැංවීමට කටයුතු කිරීම, තෙල් මඩු ප්‍රමිතිකරණයට ලක් කිරීම, අධීක්ෂණය කිරීම මෙන්ම තෙල්වල ගුණාත්මය පාලනය සඳහා පියවර ගැනීම සහ ගබඩාකරණය සඳහා පහසුකම් සැපයීම තුළින් වෙළඳපොළ මිල විචලතාවයන්ගෙන් ප්‍රයෝජන ගැනීමට හැකිවන පරිදි කර්මාන්තකරුවන්ගේ ධාරිතාවය වර්ධනය කිරීම යනාදිය සිදු කළ යුතු බවට අධ්‍යයනයෙන් නිර්දේශ කෙරේ.

කර්මාන්තයේ පවතින පරිමාණානුකූල ඵල හේතුවෙන් නව ආයෝජකයින් හට අපනයනයට ප්‍රවේශවීම දුෂ්කර වී ඇත. ඒ අනුව සගන්ධ තෙල් වෙළඳපොළ තුළ බොහෝ දුරට කතිපයාධිකාරී වෙළඳපොළක (Oligopoly) ලක්ෂණ හඳුනා ගත හැකි වේ. අපනයන කෘෂිබෝග සංවර්ධන දෙපාර්තමේන්තුව හා අපනයන සංවර්ධන මණ්ඩලය ඒකාබද්ධව සගන්ධ තෙල් අපනයනය තුළ පවතින බාධක අවම කරමින් නව කර්මාන්තකරුවන් පුහුණු කර වෙළෙඳපොළට අවතීර්ණවීමේ ඉඩ ප්‍රස්ථා ඇති කිරීම තුළින් ශ්‍රී ලංකාවේ කෘෂි අංශය මගින් ජාතික ආදායමට ලබා දෙන දායකත්වය තිරසාර ලෙස ඉහළ නැංවීමට හැකියාව ලැබෙනු ඇතැයි අපේක්ෂා කරමු.